සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - Grade 13 - 2025

ගිණුම්කරණය I
Accounting I

33 S I

පැය දෙකයි
Two Hours

නම / විභාග අංකය: ....

උපදෙස්

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
- සෑම ප්‍රශ්නයකට ම **සමාන** ලකුණු හිමි වේ.
- **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

I පත්‍රය සඳහා	
ප්‍රශ්න අංකය	**ලකුණු**
01 - 30	
31 - 50	
එකතුව	

01. පහත දැක්වෙන කුමන ප්‍රකාශය ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික අරමුණ වඩාත් හොඳින් විස්තර කරනු ලබයි ද?
    1. වාර්ෂික විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම.
    2. ව්‍යාපාර ගණුදෙනු ගිණුම් පොත්වල වාර්තා කිරීම.
    3. ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.
    4. කළමණාකරුවන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම.
    5. බදු අය කිරීම සඳහ රජයට අවශ්‍ය තොරතුරු සැපයීම (................)

02. ව්‍යාපාරයක් දැකිය හැකි අනාගත කාලයක් මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යන බැවින් වර්ෂයකට වරක් මූල්‍ය ප්‍රතිඵලය ගණනය කිරීමට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ,
    1. උපචිත
    2. ගැළපුම්
    3. අඛණ්ඩ පැවැත්ම
    4. ආරක්ෂණ
    5. කාලච්ඡේද (................)

03. ජංගම නොවන වත්කමක ඵලදායි ජීවකාලය පුරා එහි ක්ෂයවීම් ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනීමට භාවිත කරන ගිණුම්කරණ සංකල්පය කුමක් ද?
    1. ගැළපුම්
    2. ඒකක
    3. යථාරූපී
    4. ප්‍රමාණාත්මක බව
    5. උපලබ්ධි (................)

04. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව පහත කුමන දෑ මූල්‍ය තොරතුරුවල මූලික ගුණාත්මක ගති ලක්ෂණ ලෙස සලකනු ලබයි ද?
    1. විශ්වසනීය නියෝජනය සහ කාලීන බව
    2. අදාළ බව සහ විශ්වසනීය නියෝජනය
    3. අදාළ බව සහ අවබෝධ කරගත හැකි බව
    4. විශ්වාසනීය නියෝජනය සහ සත්‍යාපනය කල හැකි බව
    5. අවබෝධ කරගත හැකි බව සහ විශ්වසනීය නියෝජනය (................)

* අංක 5, 6, 7 හා 8 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

මයුමි වෙළඳ ව්‍යාපාරය 18% VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයකි.
2025 මාර්තු මාසය තුල සිදු වූ ගණුදෙනු පහත දැක්වේ.

අංකය **ගණුදෙනුව**

1. පිරිවැය රු. 200,000 වූ භාණ්ඩ තොගයක් 10% වෙළඳ වට්ටමකට යටත්ව මිහිදුගෙන් ණයට ගැනීම (VAT රහිතව)
2. රු. 30,000 පිරිවැය වූ තොගයක් මිහිදුට ආපසු යැවීම
3. ඉතිරි තොග සියල්ල රු. 236,000 (VAT සහිත මිල) ට අමාලිට ණයට විකුණන ලදි.

05. ඉහත ගණුදෙනුවල ශුද්ධ බලපෑම පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වනු ලබයි ද?

	වත්කම් (රු. 000)	=	වගකීම් (රු. 000)	+	හිමිකම් (රු. 000)
1.	+ 180		+ 180		-
2.	+ 212.4		+ 212.4		-
3.	+ 212.4		+ 182.4		+ 50
4.	+ 263		+ 213		+ 50
5.	+ 268.4		+ 212.4		+ 50

(................)

06. ඉහත ගණුදෙනු අංක 1 සහ 2 මිහිදුගේ ව්‍යාපාරයේ සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන උපයෝගී පොත් පිළිවෙළින්,

1. ගැනුම් ජ'නලය සහ ආපසු යැවුම් ජ'නලය
2. ගැනුම් ජ'නලය සහ ආපසු එවුම් ජ'නලය
3. ගැනුම් ජ'නලය සහ විකුණුම් ජ'නලය
4. විකුණුම් ජ'නලය සහ ආපසු යැවුම් ජ'නලය
5. විකුණුම් ජ'නලය සහ ආපසු එවුම් ජ'නලය (................)

07. අංක 1 ගණුදෙනුව මයුමිගේ ව්‍යාපාරයේ ලෙජරයට පිටපත් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

1.	ගැනුම් ගිණුම හර	180	
	ණයහිමි පාලන ගිණුම බැර		180
2.	ගැනුම් ගිණුම හර	200	
	VAT ගිණුම හර	36	
	ණයහිමි පාලන ගිණුම බැර		236
3.	ගැනුම් ගිණුම හර	180	
	VAT ගිණුම හර	32.4	
	ණයහිමි පාලන ගිණුම බැර		212.4
4.	ගැනුම් ගිණුම හර	180	
	VAT ගිණුම හර	32.4	
	මුදල් ගිණුම බැර		212.4
5.	ගැනුම් ගිණුම හර	212.4	
	ණයහිමි පාලන ගිණුම බැර		212.4

(................)

08. මයුමිගේ ව්‍යාපාරය 2025 මාර්තු මාසය තුළ උපයන ලද දළ ලාභය කොපමණ ද?

1. රු. 21,000
2. රු. 24,000
3. රු. 36,000
4. රු. 50,000
5. රු. 86,000 (................)

09. ව්‍යාපාරයක 2025.03.31 දිනට ලැබූ බැංකු ප්‍රකාශණයේ ශේෂය රු. 420,000 වූ අතර එදිනට මුදල් ගිණුමේ ශේෂය මීට වෙනස් වූයෙන් පහත තොරතුරු හෙළිදරව් කරගෙන ඇත.

- තැන්පත් කළ නමුත් උපලබ්ධි වී නොමැති චෙක්පත් රු. 26,000.
- බැංකුව අයකළ ගාස්තු රු. 12,000.
- නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 54,000.
- බැංකුවට ලැබූ සෘජු ප්‍රේෂණ රු. 41,000.

2025.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය කොපමණද?

1. රු. 366,000
2. රු. 392,000
3. රු. 408,000
4. රු. 449,000
5. රු. 461,000 (................)

★ අංක 10, 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

පහන්ගේ ව්‍යාපාරයේ 2025.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලින් රු. 620,000 ලාභයක් පෙන්වූ අතර එදිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 460,000 ක් විය. පසුව කරන ලද විමර්ෂණයේ දී පහත වැරදි හෙළිදරව් වී ඇත.

- රු. 520,000 වූ විකුණුම් ජ'නලයේ වටිනාකම තීරුවේ එකතුව ලෙජරයට පිටපත්කර ඇත්තේ රු. 250,000 ලෙසිනි.
- ණය ගැතියන්ට ලබාදුන් වට්ටම් රු. 30,000 ක් දුන් වට්ටම් ගිණුමේ නිවැරදිව සටහන් කළ ද ණයගැති පාලන ගිණුමට හර කර ඇත.
- රු. 15,000 කපාහල හානි කරන අලාභ ණයගැති පාලන ගිණුමේ පමණක් සටහන් කර ඇත.
- ආපසු එවුම් රු. 22,000 ණයගැතියාගේ ගිණුමේ සටහන් වී නැත.

10. ඉහත වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය කොපමණ ද?

1.	රු. 45,000 හර	2.	රු. 45,000 බැර	3.	රු. 60,000 හර
4.	රු. 60,000 බැර	5.	රු. 75,000 හර		(................)

11. 2025. 03. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු ණය ගැති පාලන ගිණුමේ ශේෂය කොපමණ ද?

1.	රු. 400,000	2.	රු. 438,000	3.	රු. 648,000
4.	රු. 670,000	5.	රු. 730,000		(................)

12. 2025. 03. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ලාභය කොපමණ ද?

1.	රු. 590,000	2.	රු. 605,000	3.	රු. 875,000
4.	රු. 890,000	5.	රු. 920,000		(................)

13. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ "**දිනුම**" ක්‍රීඩා සමාජයේ පහත තොරතුරු දැකිය හැකි විය.

		(රු. 000)
- 2024.04.01 දිනට -	සමුච්චිත අරමුදල	510
	හිඟ සාමාජික මුදල්	40
	ගොඩනැගිලි පරිත්‍යාග අරමුදල	800
වර්ෂය තුල සිදුවූ ගණුදෙනු		
	- ලැබූ සාමාජික මුදල	360
	- ගොඩනැගිලි පරිත්‍යාග වලින් ගොඩනැගිලි ඉදිකිරීම්	480
2025.03.31 දිනට	- කලින් ලද සාමාජික මුදල්	24
	- ලැබිය යුතු සාමාජික මුදල්	48

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම සහ 2025.03.31 දිනට සමුච්චිත අරමුදල කොපමණ ද?

	සාමාජික මුදල් ආදායම (රු. 000)	**සමුච්චිත අරමුදල** (රු. 000)
1.	320	510
2.	320	854
3.	320	990
4.	344	510
5.	344	1334

(................)

✳ අංක 14, 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

අසිත, නිසිත හා ලසිත 3 : 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයෙන් 2024.04.01 දින ලසිත විශ්‍රාම ගත් අතර එදිනට හවුල් ව්‍යාපාරයේ මුළු කීර්තිනාමය රු. 120,000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී.

- 2024.04.01 දිනට ගිණුම් ශේෂ පහත පරිදි වේ.

හවුල් කරු	**ප්‍රාග්ධන ගිණුම් ශේෂය (රු. 000)**	**ජංගම ගිණුම් ශේෂය (රු. 000)**
අසිත	4,000	1,200
නිසිත	3,000	(400)
ලසිත	2,000	600

- ලසිත විශ්‍රාම ගිය පසු හවුල් ගිවිසුමේ පහත කොන්දේසි ඇතුලත් විය.
  - ✳ ප්‍රාග්ධන ගිණුම් ශේෂ මත පොලිය 10% ක් ගෙවීම.
  - ✳ සෑම හවුල්කරුවකුටම රු. 50,000 බැගින් මාසික වේතන ගෙවීම.
  - ✳ නව ලාභාලාභ අනුපාතය සම සමව පවත්වා ගැනීම.
  - ✳ ලසිතගේ හිමිකම ණය ගිණුමකට මාරු කර වාර්ෂිකව 5% බැගින් පොළියක් ගෙවීම.
- 2025.03.31 දිනට අසිතගේ ජංගම ගිණුමේ ශේෂය රු. 2,600,000 බැර

14. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ලාභය කොපමණ ද?

1.	රු. 800,000	2.	රු. 1,800,000	3.	රු. 2,698,000
4.	රු. 2,700,000	5.	රු. 4,200,000		(................)

15. 2025.03.31 දිනට ලසිතගේ ණය ගිණුමේ ශේෂය කොපමණ ද?

1.	රු. 2,200,000	2.	රු. 2,620,000	3.	රු. 3,000,000
4.	රු. 3,600,000	5.	රු. 4,000,000		(................)

16. 2025.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම වන්නේ, (රු. 000)

1. රු. 10,478 2. රු. 12,280 3. රු. 13,080
4. රු. 13,280 5. රු. 13,880 (................)

17. LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව පහත කුමන අවස්ථාව/අවස්ථා ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් ලෙස සලකනු ලබයි ද?

A - දේපල පිරියත උපකරණ ක්ෂය කිරීම.
B - වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකිණීම.
C - ණයගැතියන් සඳහා හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක් කිරීම.

1. A පමණි 2. B පමණි 3. A හා B පමණි
4. B හා C පමණි 5. A, B හා C යන සියල්ලම (................)

18. සීමිත අමාලි පොදු සමාගම 2023.03.31 දින ඉඩම ප්‍රථමවරට රු. 6,200,000 ප්‍රත්‍යාගණනය කළ අතර රු. 200,000 ප්‍රත්‍යාගණන ඌණතාවයක් ඇතිවිය. 2025.03.31 දින මෙම ඉඩම නැවත රු. 6,650,000 නැවත ප්‍රත්‍යාගණන කළ අතර ගොඩනැගිලි ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් රු. 50,000 අතිරික්තයක් ඇති විය.

LKAS 16 (දේපල පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව 2025.03.31 දින ඇති වූ ප්‍රත්‍යාගණන අතිරික්තයන් සඳහා වන නිවැරදි ගිණුම්කරණ පිළිවෙත,

1. රු. 450,000 ක් වෙනත් විස්තීර්ණ ආදායම් තුල හඳුනා ගැනීම.
2. රු. 300,000 ක් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනීම.
3. රු. 500,000 ක් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගැනීම.
4. රු. 200,000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 500,000 ක් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගැනීම.
5. රු. 200,000 ක් ලාභ හෝ අලාභ තුළ සහ රු. 300,000 ක් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගැනීම. (................)

19. සීමිත ලක්ෂාන් සමාගම 2024.04.01 දින සාධාරණ අගය රු. 4,250,000 වූ මොටර් රථයක් කල්බදු පදනමට මිලට ගත් අතර එදින ම මූලික තැන්පතුව ලෙස රු. 1,000,000 ගෙවන ලදි. කල්බදු කාලය වසර 05 වන අතර කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය සමාගමට මාරු නොවන අතර මෝටර් රථයක් ඵලදායි ජීවකාලය වසර 10 කි. ගම්‍ය පොලී අනුපාතිකය 10% කි.

SLFRS 16 (කල්බදු) ප්‍රමිතයට අනුව 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු භාවිත අයිතිය සහිත වත්කමේ ක්ෂය ප්‍රමාණය සහ කල්බදු පොලී වටිනාකම,

	භාවිත අයිතිය සහිත වත්කම් ක්ෂය ප්‍රමාණය (රු.000)	**කල්බදු පොළිය (රු. 000)**
1.	325	325
2.	425	425
3.	650	325
4.	850	325
5.	850	425

(................)

20. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත මධුර සමාගමේ ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටාගෙන ඇත.

	(රු. 000)
බදු පෙර ලාභය	2500
බදු වියදම	500
මෙහෙයුම් වියදම් (රු. 60,000 ක්ෂය ඇතුළුව)	140

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටාගත් තොරතුරු

	2024.03.31 දිනට (රු.000)	2025.03.31 දිනට (රු.000)
වෙළඳ ලැබිය යුතු දෑ	120	180
තොගය	200	140
උපචිත බදු	60	240

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද? (රු.000)

1. රු. 2,240 2. රු. 2,280 3. රු. 2,460
4. රු. 2,500 5. රු. 3,000 (................)

✳ අංක 21,22 සහ 23 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත තොරතුරු භාවිත කරන්න.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**(රු. 000)**
අයභාරය	1800
විකුණුම් පිරිවැය	600
මෙහෙයුම් වියදම්	400

පහත තොරතුරු ද දැකිය හැකි විය.

- ඉඩම් ප්‍රත්‍යාගණනයෙන් රු. 300,000 අතිරික්තයක් ජනනය වී ඇති අතර ඉඩම මීට පෙර සිදුකළ ප්‍රත්‍යාගණනයෙන් රු. 120,000 ඌණතාවයක් ජනනය වී ඇත. වර්ෂය තුළ රු. 10,000 ක අතුරු ලාභාංශයක් ගෙවා ඇත.
- රු. 60,000 අවසන් ලාභාංශයක් ගෙවීම ට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කර ඇත.

21. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මුළු ආදායම සහ මුළු විස්තීරණ ආදායම

	මුළු ආදායම (රු. 000)	මුළු විස්තීරණ ආදායම (රු.000)
1.	1800	1100
2.	2100	1100
3.	2100	1980
4.	2400	800
5.	2400	1980

(................)

22. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ලාභය සහ වෙනත් විස්තීර්ණ ආදායම

	ලාභය (රු. 000)	**වෙනත් විස්තීර්ණ ආදායම (රු.000)**
1.	800	120
2.	800	300
3.	920	180
4.	920	300
5.	2100	300

(................)

23. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ හිමිකමෙහි ශුද්ධ වැඩිවීම,

1. රු. 920,000
2. රු. 1,030,000
3. රු. 1,000,000
4. රු. 1,090,000
5. රු. 1,100,000

(................)

24. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

විකුණුම්	රු. 6,000,000
විකුණුම් පිරිවැය	රු. 4,800,000
මෙහෙයුම් වියදම්	රු. 800,000
පොලී වියදම	රු. 80,000
බදු වියදම	රු. 120,000

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය කොපමණ ද?

	දළ ලාභ අනුපාතය (%)	**පොලී ආවරණ අනුපාතය (වාර)**
1.	5	2
2.	5	4.5
3.	7.5	4.5
4.	20	4.8
5.	20	5

(................)

25. සමාගමක 2025.03.31 දිනට ගණනය කළ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය 25% කි. නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත ගණුදෙනු සැලකිල්ලට ගෙන නොමැත.

A - ඉඩම් ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් රු. 60,000 ක ඌනතාවයක් ඇතිවීම.
B - රු. 40,000 ලද වට්ටම්
C - රු. 150,000 සංචිත ප්‍රාග්ධනිත කිරීම

ඉහත සඳහන් කුමන ගණුදෙනුව/ගණුදෙනු නිසා සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතයේ අගය වෙනස්වීමට ලක්වන්නේ ද?

1. A හා B
2. A හා C
3. B හා C
4. C පමණි
5. A, B හා C යන සියල්ල ම

(................)

26. සමාගමක් විසින් තම නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කරන අමුද්‍රව්‍යයක පහත තොරතුරු දැකිය හැකිය.

මාසික පරිභෝජනය ඒකක	750
එක් ඇනවුමක පිරිවැය	රු. 25
ඒකකයක් රඳවාගැනීමේ පිරිවැය	රු. 5

අමුද්‍රව්‍ය ඒකකයේ ආර්ථික ඇනවුම් ප්‍රමාණය කොපමණ ද?

1. ඒකක 300 2. ඒකක 310 3. ඒකක 860
4. ඒකක 890 5. ඒකක 900 (................)

27. සීමාසහිත සමාගමක 2025 මාර්තු මාසයේ සේවක වැටුප් පිළිබඳ පහත තොරතුරු සැපයේ.

- සේවකයන්ට ගෙවූ වැටුප රු. 8,100,000
- සේවක අර්ථසාධක අරමුදල් (EPF) දායකය 10% සහ 15% පිළිවෙලින් සේවකයා හා සේව්‍යා දායක වේ.
- සේවක භාරකාර අරමුදල් (ETF) දායකය 3% කි.

මාර්තු මාසයේ සේවකයන් වෙනුවෙන් සමාගම දරණ ලද මුළු වියදම කොපමණ ද?

1. රු. 8,100,000 2. රු. 9,000,000 3. රු. 10,620,000
4. රු. 10,920,000 5. රු. 11,240,000 (................)

28. පිරිවැය ඒකකයක් සඳහා වන පොදුකාර්ය පිරිවැය ගණනය කිරීමේදී අනුගමනය කරන පියවර නිවැරදිව අනුපිළිවෙලින් දක්වා ඇත්තේ,

1. රැස් කිරීම, විභාජනය කිරීම, ප්‍රතිපාදනය කිරීම හා අන්තර්ග්‍රහණය කිරීම
2. රැස් කිරීම, ප්‍රතිපාදනය කිරීම, විභාජනය කිරීම හා අන්තර්ග්‍රහණය කිරීම
3. ප්‍රතිපාදනය කිරීම, විභාජනය කිරීම, රැස් කිරීම හා අන්තර්ග්‍රහණය කිරීම
4. රැස් කිරීම, අන්තර්ග්‍රහණය කිරීම, ප්‍රතිපාදනය කිරීම හා විභාජනය කිරීම
5. ප්‍රතිපාදනය කිරීම, අන්තර්ග්‍රහණය කිරීම, රැස් කිරීම, විභාජනය කිරීම (................)

29. සමාගමක් විසින් විකිණීමට අපේක්ෂිත තනි භාණ්ඩයක් පිළිබඳ පහත තොරතුරු සැපයේ,

සමච්ඡේදන ලක්ෂය ඒකක	8000
ඒකකයක විකුණුම් මිල	රු. 400
ඒකකයක ස්ථාවර පිරිවැය	රු. 100

ඒකකයක විචල්‍ය පිරිවැය සහ ඒකක 10,000 විකිණීමේ දී සමාගමේ ලාභය,

ඒකකයක විචල්‍ය පිරිවැය (රු)	**ලාභය (රු)**
1. 100	100,000
2. 200	200,000
3. 200	200,000
4. 300	200,000
5. 300	400,000

(................)

30. ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය රු. 900,000 කි. අනෙකුත් සාධක නොවෙනස්ව තිබියදී පහත කුමන සාධක, ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය වැඩිවීමට බලපායි ද?

A - ව්‍යාපාර ශක්‍යතා වාර්තාව පිළියෙල කිරීමේ වියදම් වැඩිවීම

B - වට්ටම් අනුපාතය අඩුවීම

C - වාර්ෂික මෙහෙයුම් ආදායම් වැඩිවීම

D - සුන් බුන් වටිනාකම ඉහල යාම

1. A පමණි 2. A හා B පමණි 3. B හා C පමණි
4. B, C හා D පමණි 5. A, B, C, හා D, යන සියල්ලම. (................)

✳ අංක 31, 50 ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

31. ව්‍යාපාරයක් විසින් පිළියෙළ කරනු ලබන පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අදාළවේ ද නැද්ද යන්න දක්වන්න.

	ඔව් / නැත
A - මෙම ප්‍රකාශන ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කරනු ලැබේ.	....
B - මෙම ප්‍රකාශන අවශ්‍ය විටක දී පමණක් පිළියෙල කරනු ලබයි.	....
C - මෙම ප්‍රකාශන බාහිර පාර්ශවයන්ට තොරතුරු සැපයීම සඳහා පිළියෙල කෙරේ.	....
D - මෙම ප්‍රකාශන පිළියෙල කිරීම සඳහ පුරෝකථන තොරතුරු පදනම් කර ගනී.	....

32. ව්‍යාපාරයක හිමිකම වෙනස්වීමට පහත ගණුදෙනු හේතු වන්නේ ද යන්න සඳහන් කරන්න. (වැඩිවේ I, අඩුවේ D, වෙනස් නොවේ නම් NC ලෙස දක්වන්න.)

ගණුදෙනුව	(වැඩිවේ I, අඩුවේ D, වෙනස් නොවේ නම් NC)
1. ලැයිස්තුගත මිල රු. 200,000 භාණ්ඩ 10% වෙළඳ වට්ටමකට යටත්ව මිලට ගැනීම.	....
2. ණය හිමියකු පියවීමේ දී රු. 15,000 වට්ටමක් ලැබීම.	....
3. කාර්යාල උපකරණ රු. 50,000 ක්ෂය කිරීම.	....
4. රු. 150,000 සංචිත ප්‍රාග්ධනිත කිරීම	....

33. 15% VAT සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් රු.230,000 භාණ්ඩ ණයට මිලට ගෙන (රු. 30,000 VAT ඇතුළත්ව) ඒවා රු. 368,000 (රු. 48,000 VAT ඇතුළත්ව) අත්පිට විකුණන ලදි.

පහත ආකෘතියට අනුව ගිණුම්කරණ සමීකරණය තුල මෙම ගණුදෙනු වල ශුද්ධ බලපෑම පෙන්වන්න.

වත්කම් (රු.) .... = වගකීම් (රු.) .... + හිමිකම් (රු.) ....

34. ලී බඩු අලෙවි කරන ව්‍යාපාරයක පහත ගණුදෙනු සටහන් කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලේඛනය සහ උපයෝගී පොත ලියා දක්වන්න.

ගණුදෙණුව	මූලාශ්‍ර ලේඛනය	උපයෝගී පොත
A - ලී බඩු ණයට විකිණීම	....	....
B - සුළු මුදල් අග්‍රිමය ගෙවීම	....	....
C - ලී බඩු ණයට මිලදී ගැනීම	....	....
D - අයිතිකරු ව්‍යාපාරයට මුදල් යෙදවීම	....	....

35. බැංකු ජංගම ගිණුමක් මගින් ගණුදෙනු කරන ව්‍යාපාරයක පහත ගණුදෙනු සටහන් කිරීම සඳහා අවශ්‍ය ද්විත්ව සටහන් ලියන්න.

අ) සෘජු ප්‍රේෂණ ලෙස රු. 20,000 ක ආයෝජන ආදායම් ලැබීම

....

....

ආ) විදුලි වියදම් වෙනුවෙන් නිකුත් කළ රු. 55,000 චෙක්පත අගරු වීම

....

....

36. පහත පිළිවෙත්වලට අදාළ වඩාත් උචිත ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

ගිණුම්කරණ පිළිවෙත	ගිණුම්කරණ සංකල්පය
A - කල්බදු පදනමට මිලටගත් මෝටරරථයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ භාවිත අයිතිය සහිත වත්කම් ලෙස දැක්වීම	....
B - හානිකරණ අලාභ සඳහා ඉඩහැරීමක් සිදුකිරීම	....
C - වත්කම් ජංගම හා ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම	....
D - වර්ෂයේ ලාභය අයිතිකරුගේ හිමිකම තුළ ගැළපීම	....

37. පහත තොරතුරු බෑග් නිෂ්පාදන ව්‍යාපාරයකට අදාල වේ.

		රු
-	2024.04.01 දිනට අමුද්‍රව්‍ය තොගය	500,000
-	වර්ෂය තුල - අමුද්‍රව්‍ය ගැනුම්	6,000,000
	සෘජු ශ්‍රම වියදම්	2,000,000
	නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	3,000,000
-	2025.03.31 දිනට - අමුද්‍රව්‍ය තොගයේ වැඩිවීම	150,000
	නොනිමි තොගයේ අඩුවීම	2,000,000

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න. (නිෂ්පාදන පිරිවැය පදනම මත නොනිමි තොග අගය කරයි).

(අ) ප්‍රාථමික පිරිවැය රු. .... (ආ) නිෂ්පාදන පිරිවැය රු. ....

38. 2020.04.01 දින යාවජීව සාමාජිකයින් 10 ගෙන් ආරම්භ කළ ළමා සාමාජයක එක් සාමාජිකයකුගේ යාවජීව සාමාජික මුදල වසර 10 ක් තුළ ආදායමේ හඳුනාගනී. 2024.04.01 දිනට ළමා සමාජයේ යාවජීව සාමාජික අරමුදල රු. 1,200,000 කි.

(අ) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගත යුතු සාමාජික මුදල් ආදායම (රු) ....

(ආ) 2025.03.31 දිනට යාවජීව සාමාජික අරමුදල (රු.) ....

39. හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සත්‍යද (T) අසත්‍යද (F) යන්න දක්වන්න.

	ප්‍රකාශය	සත්‍යද (T) අසත්‍යද (F)
A -	ප්‍රාග්ධනය ට සියළු හවුල්කරුවන් සම සමව දායක වන විට ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවීම අවශ්‍ය නොවේ.	....
B -	නව හවුල්කරුවකු බඳවා ගන්නා විට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය පිළිබඳව ගැලපීමක් කළ යුතුය.	....
C -	හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන ලෙස ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පමණක් පිළියෙල කෙරේ.	....
D -	ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් ශේෂ මගින් හවුල් ව්‍යාපාරයක හිමිකම නිරූපනය කරනු ලබයි.	....

40. LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශන) ප්‍රමිතයට අනුව පහත එක් එක් මුදල් ප්‍රවාහයන් වර්ගීකරණය කර දක්වන්න.

	මුදල් ප්‍රවාහය	වර්ගීකරණය
A -	අත්පිට විකුණුම් වලින් ලද මුදල්	....
B -	කල්බදු ගිවිසුමක මූලික ගෙවීම	....
C -	වෙනත් සමාගමක කොටස් ආයෝජනයෙන් ලැබූ ලාභාංශ	....
D -	ගෙවූ අතුරු ලාභාංශ	....

41. සීමාසහිත සමාගමක් 2018.04.01 දින රු. 4,000,000 ට යන්ත්‍රයක් මිලට ගත් අතර එය වාර්ෂිකව 10% බැගින් ක්ෂය කරනු ලබයි. 2024.04.01 දින රු. 900,000 වියදම් කර යන්ත්‍රය නවීකරණය කළ අතර ඒ හේතුවෙන් යන්ත්‍රයේ ඵලදායි ජීවකාලය වසරකින් ඉහල යන ලදි.

අ) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂයේ යන්ත්‍ර ක්ෂය ප්‍රමාණය රු. ....

ආ) 2025.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය රු. ....

42. සීමිත මධුමාලි සමාගමේ පහත ශේෂයන් දැකිය හැකි විය.

	2024.04.01. දිනට (රු. 000)	2025.03.31 දිනට (රු. 000)
සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය	4,000	4,700
රඳවාගත් ඉපයුම්	1,500	2,000

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී රඳවාගත් ඉපයුම් භාවිත කරමින් සංචිත ප්‍රාග්ධනිත කිරීමක් සිදුකර ඇත. වර්ෂය තුළදී රු. 500,000 අතුරු ලාභාංශයක් ගෙවා ඇත.

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දෑ කොපමණද ද?

අ) වර්ෂය සඳහා උපයා ඇති ලාභය රු. ....

ආ) ප්‍රාග්ධනිත කරන ලද සංචිතවල වටිනාකම රු. ....

43. සීමිත රන්දුනු සමාගමේ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන 2025.06.30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර 2025.07.15 දින ප්‍රසිද්ධ කරන ලදි.
LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව පහත එක් එක් සිදුවීම ගලපන සිදුවීමක් ද නොගලපන සිදුවීමක් ද යන්න සටහන් කරන්න.

සිද්ධිය	ගලපන/ නොගලපන
A - 2025.03.31 දිනට රු. 120,000 වූ ණයගැතියෙකුගේ වටිනාකම අධිකරණ තීන්දුවක් මත 2025.04.30 දින හානිකරන අලාභ ලෙස ලියා හැරීම.	....
B - රු. 500,000 අවසන් ලාභාංශයක් යෝජනා කිරීම.	....
C - 2025.03.31 දිනට තිබූ තොගයෙන් රු. 100,000 තොගයක් 2025.07.20 දින රු. 90,000 උපලබ්ධි කිරීම.	....
D - රු. 6,000,000 ක රඳවාගත් ඉපයුම් ප්‍රාග්ධනිත කිරීම.	....

44. සමාගමක් විසින් අලෙවිකරන භාණ්ඩයකට පහත තොරතුරු අදාල වේ.

දිනය	විස්තරය		
2025.01.01	ශේෂය	එකක් රු. 6 බැගින් ඒකක	500
2025.01.05	ගැනුම්	එකක් රු. 8 බැගින් ඒකක	1500
2025.01.10	විකුණුම්	එකක් රු. 15 බැගින් ඒකක	1000

පහත දක්වා ඇති එක් එක් මිල කිරීමේ ක්‍රමය යටතේ පහත දෑ ගණනය කරන්න.

මිල කිරීමේ ක්‍රමය	2025 ජනවාරි මස විකුණුම් පිරිවැය (රු.)	2025.01.31 දිනට තොගයේ පිරිවැය (රු.)
(අ) පෙර පිවිසි පෙර පිට (FIFO) ක්‍රමය	....	....
(ආ) හරිත සාමාන්‍ය (WAC) ක්‍රමය	....	....

45. ආයතනයක ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය හා සම්බන්ධව පහත ප්‍රකාශ සත්‍යය ද (T) අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය (T) / අසත්‍ය (F)
A - ඉහල තොග පිරිවැටුම් අනුපාතයක් අඩු තොග රැඳවුම් කාලයක් පෙන්නුම් කරයි.	....
B - ණය හිමියන්ට මුදල් ගෙවූ විට ජංගම අනුපාතයේ අගය වෙනස් නොවේ.	....
C - ආර්ථික ඇණවුම් ප්‍රමාණයේදී මුළු ඇණවුම් පිරිවැය මුළු රඳවාගැනීමේ පිරිවැයට සමාන වේ.	....
D - ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් ජනනය වීම නිසා ශුද්ධලාභ අනුපාතය ඉහළ යයි	....

46. පිරිවැය වර්ගීකරණයට අදාලව පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.
(අ) තොග අගය කිරීම සඳහා පිරිවැය .... සහ .... ලෙස වර්ග කෙරේ.
(ආ) පිරිවැය ඒවායේ හැසිරීම මත .... සහ .... ලෙස වර්ග කෙරේ.

47. එකලස් සහ නිමැවුම් යන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් මගින් තනි භාණ්ඩයක් නිපදවනු ලබන ආයතනයකට පහත තොරතුරු අදාල වේ.

විස්තරය	එකලස් දෙපාර්තමේන්තුව	නිමැවුම් දෙපාර්තමේන්තුව
- ඒකකයක් නිපදවීමට ගතවන පැය ගණන	4	3
- ඒකකයකට අන්තර්ග්‍රහණය කරන ලද පොදු කාර්යය පිරිවැය (රු.)	600	270
- මුළු පොදු කාර්ය පිරිවැය (රු.)	900,000	360,000

එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය මත ද නිමැවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය මතද පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.
පහත දෑ ගණනය කරන්න.

	එකලස් දෙපාර්තමේන්තුව	නිමැවුම් දෙපාර්තමේන්තුව
(අ) පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය (පැයකට) රු.	....	....
(ආ) වැඩකරන ලද මුළු පැය ගණන	....	....

48. සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරන අතර එහි ඒකකයක දායකය රු. 40 වේ. පහත තොරතුරු මෙම සමාගමේ ක්‍රියාකාරී මට්ටම් දෙකකට අදාල වේ.

නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව	මුළු පිරිවැය (රු.)
3000	450,000
4000	530,000

පහත දෑ ගණනය කරන්න.

(අ) ඒකකයක විචල්‍ය පිරිවැය රු. ....

(ආ) ඒකකයක විකුණුම් මිල රු. ....

49. සීමිත සමාගමක ලාභපරිමා සටහන පහත දැක්වේ.



පහත දෑ ගණනය කරන්න.

(අ) මුළු ස්ථාවර පිරිවැය (රු.) ....

(ආ) සමච්ඡේදන ලක්ෂය (ඒකක) ....

50. සමාගමක් නව ව්‍යාපෘතියක් සඳහා රු. 1,000,000 යන්ත්‍රයක් මිලට ගැනීමට සලකා බලමින් සිටී. ඒ පිළිබඳව පහත තොරතුරු සැපයේ.

- යන්ත්‍රයේ ඵලදායිජීව කාලය වසර 5
- වාර්ෂික වියදම් ඉතිරිය රු. 400,000

මෙම ව්‍යාපෘතිය සඳහා පහත දෑ ගණනය කරන්න.

(අ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (%) ....

(ආ) පිළිගෙවුම් කාලය (වසර) ....

* * * *

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

13 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - Grade 13 - 2025

33 S II

ගිණුම්කරණය II
Accounting II

පැය තුනයි
Three Hours

අමතර කියවීම් කාලය - මි. 10 යි
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස්

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් කඩදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙර වැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 200 ක් හිමිවේ.

01. සීමිත නාදන් පොදු සමාගමේ 2025.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත වේ.

විස්තරය	හර (රු.000)	(බැර (රු.000)
දේපල පිරියත හා උපකරණ ධාරණ වටිනාකම	78 800	
විකුණුම්		100 750
2024.04.01 දිනට භාවිත අයිතිය ඇති වත්කම් ධාරණ වටිනාකම	18 000	
වෙළඳ ලැබිය යුතු දෑ	2 180	
හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම		280
වන්දි සඳහා ප්‍රතිපාදන		700
බෙදාහැරීමේ පිරිවැය	4 600	
පරිපාලන වියදම්	7 250	
මූල්‍ය පිරිවැය	460	
වෙනත් වියදම්	800	
2024.04.01 දිනට ආදායම් බදු ප්‍රතිපාදන		350
ගෙවූ ආදායම් බදු	1 500	
ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 250000)		50 000
රඳවාගත් ඉපැයුම් (2024.04.01 දිනට)		10 200
ප්‍රත්‍යාගණන සංචිතය (ඉඩම්) (2024.04.01)		600
අවිනිශ්චිත ගිණුම		400
තොගය	6 500	
විකුණුම් පිරිවැය	44 800	
2024.04.01 දිනට කල්බදු වගකීම		9 536
කල්බදු වාරික ගිණුම	3 840	
වෙළඳ ගෙවිය යුතු දෑ		3 184
මුදල් හා මුදල් සමාන දෑ	7 270	
	176 000	176 000

අතිරේක තොරතුරු ඃ-

2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට පෙර පහත දෑ සඳහා ගැලපීම් කළ යුතු වේ.

(i) 2025.03.31 දිනට තොගය, අයිතම තුනකින් සමන්විත වූ අතර ඒවායේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන් පහත පරිදි විය.

අයිතමය	පිරිවැය (රු.000)	ශුද්ධ උපලබ්ධි අගය (රු.000)
P	2 500	3 200
Q	2 400	2 200
R	1 800	1 100
	6 700	6 500

පිරිවැය හා ශුද්ධ උපලබ්දි අගය යන දෙකෙන් අඩු අගයට තොග මිණුම් කිරීමේදී අයිතම ක්‍රමය පදනම් කර ගැනීම සමාගමේ ප්‍රතිපත්තිය වේ. කෙසේ වුවද මෙම ප්‍රතිපත්තියට පටහැනිව 2025.03.31 දිනට තොගය මිණුම් කර ඇත්තේ මෙම අයිතම තුනෙහි ම මුළු පිරිවැය හා මුළු ශුද්ධ උබලබ්ධි අගය සන්සන්දනය කිරීමෙනි. ඒ අනුව තොගයේ පිරිවැය රු. 200 000 කින් කපා හැර ඇති අතර, එය වෙනත් වියදම් තුල ඇතුලත් කර ඇත.

ii. 2025.03.31 දිනට හානිකරණ අලාභ සඳහා ඉඩහරින ලද රු. 80 000 ක ණයගැතියකු බුන්වත් වී ඇති බව අධිකරණය විසින් 2025.05.20 දින තීන්දු කරන ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන 2025.06.30 දින අනුමත කරන ලදි.

iii. 2025.03.31 දිනට දේපළ පිරියත හා උපකරණවල ට අදාළ තොරතුරු පහත දැක්වේ.

විස්තරය	පිරිවැය/ප්‍රත්‍යාගණන (රු.000)	ධාරණ අගය (රු.000)
ඉඩම්	40 000	40 000
ගොඩනැගිලි	48 000	32 000
කාර්යාල උපකරණ	8 000	6 800
	96 000	78 800

- 2024.04.01 දින මෙම ඉඩම් දෙවන වරට ප්‍රත්‍යාගණනය කර, ලද අතිරික්තය ඉඩම් ගිණුම හර කර අවිනිශ්චිත ගිණුම බැර කර ඇත. ශේෂ පිරික්සුමේ ඇති ප්‍රත්‍යාගණන සංචිතයෙන් නිරූපණය වන්නේ මීට වසර දෙකකට පෙර ප්‍රත්‍යාගණනයෙන් ලද අතිරික්තය වේ. වර්ෂය තුල ඉඩම් මිලට ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුකර නොමැත.

- ගොඩනැගිලි වලින් දැක්වෙන්නේ 2024.04.01 දිනට පැවති පිරිවැය හා ධාරණ අගය වේ. 2024.04.01 දින ගොඩනැගිලි රු. 30 000 000 කට ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කර ඇති නමුත් ගිණුම්ගත කර නොතිබුණි. ගොඩනැගිලිවල ඉතිරි ඵලදායි ජීව කාලය වසර 15 ක් බවට ඇස්තමේන්තු කර ඇත.

- 2023.01.01 දින රු. 400 000 කට මිලට ගත් කාර්යාල උපකරණයක් 2025.01.01 දින රු. 300 000 කට විකුණා ලද මුදල විකුණුම් ගිණුමට බැර කිරීම හැර වෙනත් ගිණුම් සටහනක් තබා නොමැත. කාර්යාල උපකරණ පිරිවැයට 10% බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුය. කාර්යාල උපකරණ ප්‍රවර්තන වර්ෂයට අදාල ක්‍ෂය ගිණුම් ගත කර නොමැත.

iv. 2023.04.01 දින කල්බදු ගිවිසුමකට එළෙඹ, අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රයෝජනය සඳහා වසර 4 ක කාලයකට මෝටර් රථයක් භාවිත අයිතිය සඳහා ලබා ගෙන ඇත. වාර්ෂික කල්බදු වාරිකය වූ රු.3 840 000 ක් ගෙවා කල්බදු වාරික ගිණුමට හර කිරීම හැර වෙනත් සටහනක් තබා නොමැත. 2024/25 හා 2025/26 සඳහා පොළිය පිළිවෙලින් රු. 952 000 ක් හා රු. 464 000 ක් වේ. කල්බදු ගිවිසුම අවසානයේ වත්කමේ අයිතිය සමාගමට මාරු නොවේ.

v. සමාගම විසින් විකිණීමට හා විකිණීමෙන් පසු පළමු වසර තුල නඩත්තු සේවා සැපයීම සඳහා 2024.12.01 දින ගණුදෙණු කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹෙන ලදි. ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාව රු. 2 500 000 ක් වන අතර, එයින් රු. 600 000 ක් නඩත්තු සේවා සඳහා වේ. 2025.01.01 දින සියළුම භාණ්ඩ විකුණුම් කරනු ලැබූ අතර, ගිවිසුමේ මුළු ප්‍රතිෂ්ඨාව එකවර ලැබී විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත.

vi. වර්ෂය තුල ගෙවූ ශුද්ධ වැටුප වූ රු. 1 840 000 පරිපාලන වියදම් තුල ඇතුලත් වේ. සේවක හා සේව්‍ය අර්ථසාධක අරමුදල් දායකයන් (EPF) දළ වැටුප මත පිළිවෙලින් 8% ක් 12% ක් වේ. සේවක භාර අරමුදල් දායකය (ETF) 3%කි. EPF හා ETF දායකයන් ගෙවා හෝ ගිණුම්ගත කිරීමක් සිදුකර නොමැත. සේවකයන්ගේ වැටුපෙන් අඩු කරනුයේ ඔවුන්ගේ EPF දායකය පමණි.

vii. ශේෂ පිරික්සුමේ දක්වා ඇති ගෙවූ ආදායම් බදු තුල පසුගිය වසර සඳහා ගෙවූ රු. 400 000 ක් ඇතුලත් වේ. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වියදම රු.7 600 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

viii. ශේෂ පිරික්සුම තුල ඇති වන්දි සඳහා ප්‍රතිපාදනය, සමාගමට එරෙහිව ගණුදෙනුකරුවකු විසින් ගොනුකරන ලද නඩුවක් වෙනුවෙනි. 2025.06.01 දින අධිකරණය විසින් ලබා දුන් තීන්දුව මත සමාගමට ගෙවීමට සිදුවූයේ රු.500 000 කි.

ix. සමාගම 2025.03.31 දින එදිනට පැවති සෑම සාමාන්‍ය කොටස් 4 කටම එක බැගින් වූ කොටසක් රු. 200 ක ප්‍රතිෂ්ඨාවක් යටතේ හිමිකම් නිකුතුවක් කර තිබූ අතර එය නිවැරදිව ගිණුම්ගත කර තිබුණි.

අවශ්‍ය වන්නේ,

LKAS 1(මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත නාදන් පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද ඇතුළුව)

(1) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
(2) 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(3) 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

(ලකුණු 40)

2. (අ) එක්තරා භාණ්ඩයක් නිෂ්පාදනය කරන පර්ල් සමාගම එම නිෂ්පාදනය සඳහා M_1 නැමති අමුද්‍රව්‍ය භාවිත කරයි. ඇස්තමේන්තුවලට අනුව මෙම අමුද්‍රව්‍යට අදාල තොරතුරු පහත වේ.

උපරිම පරිභෝජනය මසකට 1,500 kg
සාමාන්‍ය පරිභෝජනය මසකට 1,000 kg
අවම ඇණවුම් කාලය මාස 2 යි.
සාමාන්‍ය ඇණවුම් කාලය මාස 3 කි.
ආර්ථික ඇණවුම් කිරීමේ ප්‍රමාණය 4000 kg

පිරිවැය ව්‍යුහයේ සිදු වූ වෙනසක් නිසා M_1 අමුද්‍රව්‍යයෙහි ආර්ථික ඇණවුම් ප්‍රමාණය සංශෝධනය කිරීමට පර්ල් සමාගම බලාපොරොත්තු වේ.

සංශෝධිත ඇණවුම් කිරීමේ පිරිවැය ඇණවුමකට රු. 10,000 කි.

සංශෝධිත තොග පවත්වා ගැනීමේ පිරිවැය 1000 kg ක් සඳහා වර්ෂයකට රු. 100,000 කි. අමුද්‍රව්‍ය සඳහා වාර්ෂික ඉල්ලුම 125,000 kg කි.

අවශ්‍ය වන්නේ,

(i) පිරිවැය ව්‍යුහය සංශෝධනය කිරීමට පෙර පහත දෑ ගණනය කිරීම.
1. යළි ඇණවුම් මට්ටම
2. අවම තොග මට්ටම
3. උපරිම තොග මට්ටම

(ii) පිරිවැය ව්‍යුහය සංශෝධනයෙන් පසු ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) (ලකුණු 10)

(ආ) නිෂ්පාදන සමාගමක් විසින් 'A' සහ 'B' නම් වූ භාණ්ඩ වර්ග දෙකක් නිෂ්පාදනය කරනු ලැබේ. මෙම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා 'එකලස්' හා 'නිමවුම්' නම් වූ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් හා 'ගබඩාව' යන සේවා පිරිවැය මධ්‍යස්ථානයක් සමාගම විසින් භාවිත කරනු ලබයි. මෙම සියළුම පිරිවැය මධ්‍යස්ථාන එකම ගොඩනැගිල්ලක පිහිටා ඇත.

ක්‍රියාකාරී මට්ටම ඒකක 2500 කට අදාලව සමාගමේ ගිණුම් සහයක විසින් ඉදිරි වර්ෂය සඳහා පහත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කර තිබුණි.

එකලස් පිරිවැය මධ්‍යස්ථානය - යන්ත්‍ර පැයක් සඳහා රු. 40

නිමවුම් පිරිවැය මධ්‍යස්ථානය - සෘජු ශ්‍රම පැයක් සඳහා රු. 50

(එකලස් පිරිවැය මධ්‍යස්ථානය යන්ත්‍ර පැයද, නිමවුම් පිරිවැය මධ්‍යස්ථානය සෘජු ශ්‍රම පැය මත ද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අන්තර් ග්‍රහනය කෙරේ.)

කෙසේ වුවද මෙම අනුපාත ගණනය කිරීමේදී පහත වැරදි හා මගහැරීම් සිදු වී ඇති බව පසුව කරන ලද විමර්ශනවල දී හෙළි වී ඇත.

(i) ගිණුම් සහායක විසින් ගණනය කර තිබූ ගබඩාවේ මුළු පොදු කාර්ය පිරිවැය රු. 160,000 එකලස් හා නිමවුම් පිරිවැය මධ්‍යස්ථාන වලට නිවැරදි අනුපාතය වන 3:1 වන සේ ද්විතීක විභජනය කර තිබුණි. කෙසේ නමුත් ගබඩාවට සහ එකලස් පිරිවැය මධ්‍යස්ථානයට ප්‍රතිපාදනය කර තිබූ සුළු සේවක වැටුප් පිළිවෙලින් රු. 40,000 ක් හා රු. 20,000 ක් නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය ගණනය කිරීමේදී සැලකිල්ල ගෙන නොතිබුණි.

(ii) නිෂ්පාදන නොවන ස්ථාවර පොදු කාර්ය පිරිවැය වූ රු. 240,000 ක් ද එකලස් හා නිමැවුම් පිරිවැය මධ්‍යස්ථාන අතර පිළිවෙලින් 1:2 අනුපාතයට විභජනය කර තිබුණි.

(iii) තවද පහත නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අයිතමයන් පොදු කාර්ය පිරිවැය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැත.

කර්මාන්ත ශාලා කුලිය	රු. 100,000
විදුලි ගාස්තු	රු. 300,000
යන්ත්‍ර ක්ෂය	රු. 450,000
තොරතුරු පද්ධතියේ නඩත්තු පිරිවැය	රු. 360,000

- **අතිරේක තොරතුරු**

  පිරිවැය මධ්‍යස්ථාන වලට අදාල තොරතුරු

	එකලස්	**නිමැවුම්**	**ගබඩාව**
කිලෝවොට් පැය	10,000	8,000	2,000
යන්ත්‍ර පිරිවැය (රු.000)	80	40	-
භූමි ප්‍රමාණය (වර්ග මීටර්)	1500	750	250
තොරතුරු පද්ධතිය මඟින් ජනනය කරනු ලබන වාර්තා සංඛ්‍යාව	60	120	-

- සමාගම විසින් නිපදවනු ලබන භාණ්ඩ දෙක සඳහා පහත තොරතුරු අදාළ වේ.

	A භාණ්ඩය	**B භාණ්ඩය**
ඒකකයක ප්‍රාථමික පිරිවැය (රු.)	875	890
ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය පැය :		
යන්ත්‍ර පැය	5	6
ඍජු ශ්‍රම පැය	4	8
ක්‍රියාකාරී මට්ටම තුල අයවැය ගත නිෂ්පාදන ඒකක ගණන	1000	1500

- සමාගම විසින් නිෂ්පාදන පිරිවැය මත 25% ක ලාභාංතිකයක් තබා ගනිමින් A හා B භාණ්ඩවල විකුණුම් මිල තීරණය කරයි.

අවශ්‍ය වන්නේ,

(1) විභජන පදනම පැහැදිලිව දක්වමින් සංශෝධිත පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එකලස් හා නිමවුම් පිරිවැය මධ්‍යස්ථාන සඳහා සංශෝධිත පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත

(3) A භාණ්ඩය හා B භාණ්ඩයේ ඒකකයක් සඳහා නිෂ්පාදන පිරිවැය

(4) ක්‍රියාකාරී මට්ටම ඒකක 2500 දී මුළු විකුණුම් ආදායම (ලකුණු 30)

(මුළු ලකුණු 40)

3. (අ) චමිල එන්ටප්‍රයිසස් කේවල ස්වාමී ව්‍යාපාරයකි. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි ගතවේ. 2025.03.31 දිනට එහි සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගත් වත්කම් හා වගකීම් පිළිබඳ ශේෂයන් පහත වේ.

	2025.03.31 දිනට (රු.000)
දේපළ පිරියත හා උපකරණ ධාරණ වටිනාකම	2500
තොගය	180
වෙළඳ හා වෙනත් ලැබිය යුතුදෑ	450
මුදල්	420
බැංකු ණය	800
වෙළඳ ගෙවිය යුතු දෑ	300
VAT - බැර ශේෂය	20

2025 අප්‍රේල් මාසය තුල දී පහත ගණුදෙණු ව්‍යාපාරයේ සිදු විය.

අංකය **ගණුදෙනුව**

1. අයිතිකරු විසින් රු. 80,000 ක වෙළඳ භාණ්ඩ තොගයක් සහ රු. 120,000 ක් වටිනා කාර්යාල උපකරණයක් ව්‍යාපාරයට යෙදවීම.
2. 10% ක වට්ටමකට යටත්ව ණයගැතියෙකුගෙන් ලද මුදල රු. 180,000 කි.
3. පිරිවැය රු. 80,000 ක් වූ භාණ්ඩ 18% ක VAT සහතව රු. 177,000 කට ණයට විකුණන ලදි.
4. රු. 15,000 ක පොලී සමඟ රු. 70,000 ක් මාසික බැංකු ණය වාරිකය ගෙවීම.

5. 10% ක මුදල් වට්ටමක් ලැබීමෙන් පසුව ආරම්භක වෙළඳ ණයහිමියන්ට රු. 270,000 ක් ගෙවන ලදි.
6. 18% ක VAT සහිතව රු. 590,000 කට වෙළඳ භාණ්ඩ ණයට ගන්නා ලදි.
7. ණයට මිලදී ගත් භාණ්ඩ වලින් රු. 59,000 (18% VAT සහිත) ක භාණ්ඩ සැපයුම්කරු වෙත ආපසු යවන ලදි.
8. පිරිවැය රු. 100,000 ක් වූ භාණ්ඩ 18% ක VAT සහිතව අත්පිට විකුණුම් රු. 177,000 ක් විය.
9. පිරිවැය රු. 40,000 ක තොගයක් හදිසි ගින්නක් හේතුවෙන් විනාශ වී ඇති අතර, ඒ සඳහා 75% ක රක්ෂණ වන්දිය ලබා දීමට රක්ෂණ සමාගමක් එකඟත්වය ප්‍රකාශ කර ඇත.
10. මාසය තුල ණයට විකුණූ භාණ්ඩ වලින් රු. 23,600 ක (18% VAT සහිත) භාණ්ඩ ගනුදෙණුකරු විසින් ආපසු එවන ලදි. මෙම භාණ්ඩ වල පිරිවැය රු. 12,000 කි.
11. මාසය තුලදී රු. 75,000 ක් වෙනත් ආදායම් ලෙස උපයාගෙන ඇති අතර, එයින් රු. 25,000 ක් ලැබිය යුතුව ඇත.
